ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2015 දෙසැම්බර් මස 11 වන දින
ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 09 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[45 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.00 යි　　　　තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයට 291ඇ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ වෙනස් වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වර්ගික හෝ ජාතික අසමගියට මඟ සලසන දරුණු වූ හෝ සතුරු වූ ක්‍රියා ඇති කරන හෝ ඊට තැත් කරන තැනැත්තන් වැරදිකරුවන් කිරීමට සහ ඔවුන්ට දඬුවම් කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.—ඕ. 28/2015.

## (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක  දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

19 වන අධිකාරයට 291ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 291ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම සංග්‍රහයේ 291ඇ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“දරුණු වූ, සතුරු වූ ක්‍රියා යනාදිය ඇති කිරීම හෝ ඒ සඳහා පෙළඹවීම.

291ඇ. භාෂිත, ලිඛිත හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනයෙන්, හෝ සංඥාවලින්, හෝ දැකිය හැකි නිරූපණවලින්, හෝ අන්‍යාකාරයෙන්, ජන කොටස් අතර හෝ වෙනස් පන්තිවල තැනැත්තන් අතර හෝ වෙනස් වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර, දරුණු ක්‍රියා හෝ ආගමික, වාර්ගික හෝ ජාතික අසමගිය හෝ, අසන්තෝෂය හෝ, සතුරු බව ඇති කරන හෝ තැත් කරන, නැතහොත් ඊට පොළඹවන හෝ තැත් කරන යමකුට, අවුරුදු දෙකක් දක්වා කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 009557—475 (2015/12)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.